# ප්‍රිමාටාවන් තුළින් නිරූපණය වන මානව සංස්කෘතිය

# (ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාල භූමියේ සිටින හැලි වඳුරු කණ්ඩායමක් පිළිබඳ කළ අධ්‍යයනයක් ඇසුරින්)

මනෝෂා නිරංජලී රත්නායක[58]

---

මානව පරිණාමය පිළිබඳව සිදුකරනු ලබන පර්යේෂණවල දී නූතන අග්‍රේෂයන් සහ මානවයා අතර ඇති කායික සහ චර්යාත්මක ලක්ෂණ අධ්‍යයනය කරයි. මෙහි දී කායික ලක්ෂණ වෙත දක්වන්නේ වැඩි අවධානයකි. නමුත් මානවයාගේ සංස්කෘතික පරිණාමය අවබෝධ කර ගැනීමෙහිලා එහි මූලික සහ සරල අවධීන් වෙත අවධානය යොමු කළ යුතු අතර ඒ කෙරෙහි දායක වනුයේ අග්‍රේෂයන්ගේ චර්යා සහ සංස්කෘතිය හැදෑරීමයි. මෙම පර්යේෂණය මඟින් සිද්ධි අධ්‍යයනයක් ලෙස තෝරාගත් වඳුරන් කණ්ඩායමකගේ දෛනික චර්යා රටාව අධ්‍යයනය කර ඔවුන්ගේ චර්යා හා මානව චර්යා අතර පවතින සමානතා පිළිබඳ අවධානය යොමු කෙරේ. පරිණාමවාදී න්‍යාය අනුව වසර මිලියන ගණනකට පෙර වානර වර්ගයේ සත්ත්ව විශේෂයකින් මිනිසා පරිණාමය වූ බව සනාථ කෙරෙන නමුදු ප්‍රිමාට ගෝත්‍රයට අයත් සතුන්ගේ සංස්කෘතිය පිළිබඳව වැඩි අවධානයක් යොමු කර නොමැත. එබැවින් ප්‍රිමාට ගෝත්‍රයට අයත් සත්ත්ව කාණ්ඩයක් වන හැලි වඳුරන්ගේ චර්යා පිළිබඳ සංස්කෘතිමය අධ්‍යයනයක් තුළින් ඔවුන්ගේ සංස්කෘතිය හා මානව සංස්කෘතිය අතර සමානත්වයක් තිබේ ද? ඔවුනොවුන් අතර පවතින ගති ලක්ෂණ සමාන වේ ද? යන්න සොයා බැලිමට ගත් උත්සාහයක් ලෙස මෙම පර්යේෂණය පෙන්වාදිය හැකි ය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා තිබෙන ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාල භූමිය පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය විය. පර්යේෂණයේ දත්ත රැස් කිරීම ක්ෂේත්‍ර සමීක්ෂණය සහ පුස්තක අධ්‍යයනය මඟින් සිදු කරනු ලැබූ අතර අන්තර්ජාලය ඔස්සේ ද ප්‍රිමාටාවන් සම්බන්ධයෙන් පළ කරන ලද ලිපි ලේඛන හා වීඩියෝ දර්ශන භාවිතයට ගන්නා ලදි.ශ්‍රී ලංකාවේ ප්‍රිමාට අධ්‍යයනයන්වල දී වඳුරන් පිළිබඳ අඩු අවධානයක් යොමු කර තිබේ. නමුත් මානව පරිණාමය පිළිබඳ සැලකීමේ දී අනිකුත් ප්‍රිමාටාවන්ට මෙන් ම සුවිශේෂී ස්ථානයක් වඳුරන්ට ද හිමිවන බැවින් මොවුන්ගේ විද්‍යාත්මක සහ සංස්කෘතික ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය වැදගත් වේ. වත්මන් මානවයාගේ මුල් පූර්වජයෙකු වන මොවුන් පිළිබඳ සංස්කෘතිමය වශයෙන් ප්‍රිමාටවේදී අධ්‍යයනයක් තුළින් ආදි මානව සමාජය හඳුනාගැනීම කෙරෙහි මෙම අධ්‍යයනය වැදගත් වේ.මෙම ප්‍රිමාට සහ මානව චර්යා අධ්‍යයනයෙන් ඔවුන්ගේ චර්යාවන් බොහෝමයක් සමාන ලක්ෂණයන්ගෙන් යුත් බව ගම්‍යමාන විය. මිනිසා තරම් සංකීර්ණ නොවුව ද මානවයාගේ මුල් පූර්වජයන් වන මෙම සත්ත්ව කාණ්ඩ අතර ද සරල වූ සංස්කෘතියක් ගොඩනැඟී ඇති බව ත් මිනිසා සතු සුවිශේෂී ලක්ෂණ කිහිපයක් හැරුණු විට මොවුන් අතර පවතින බොහෝ ක්‍රියාකාරකම් හා චර්යා රටා සමතාවයක් පෙන්නුම් කරන බව ත් සුපැහැදිලිව ගම්‍යමාන වේ.

ප්‍රමුඛ පදඃපරිණාමය, ප්‍රිමාට, මානව, සංස්කෘතිය, චර්යා

---

[58] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.